# ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය

## යෝජනා ඉදිරිපත් කිරීම සඳහා ඇරයුම

## නැණසල ව්‍යාපෘතිය

## ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ නැණසල මධ්‍යස්ථානයක

## හිමකාරීත්වය

(Version 21/02/2008)



PDF Created with deskPDF PDF Writer - Trial :: http://www.docudesk.com

1 කොටස

**ඇරයුම් ලිපිය**

1 ඊ - ශ්‍රී ලංකා සංවර්ධන ව්‍යාපෘතියේ වියදම් සඳහා ශ්‍රී ලංකා තොරතුරු හා සංනිවේදන තාක්ෂණ ආයතනය (ICTA)– ජාත්‍යන්තර සංවර්ධන සංගමයෙන් (IDA) ණයක් ලබා ගැනිම සඳහා සාකච්ඡා කොට ඇත .

2 න්‍යාය (Schedule)– පත්‍රයේ ඇති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක් තුළ නැණසල පිහිටුවිම සඳහා සියළුම සුදුසුකම් ලත් සංගම් සහ පූජනීය ස්ථාන යෝජනා ඉදිරිපත් කිරිම සඳහා ආරාධනා කිරීමට (ICTA ) බලාපොරෙත්තු වේ .

3 මෙම ලේඛණයේ සඳහන් කර ඇති විධි විධානයන්ට අනුකූලව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුල සාර්ථක නැණසල මධ්‍යස්ථාන හිමිකරුවන් තෝරා ගනු ඇත .

4 මේ පිළිබදව උනන්දුවක් දක්වන පාර්ශවයන් යෝජනා භාරදිමට අදාළ ලියවිලි න්‍යාය පත්‍රයේ සඳහන් කර ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් හා ග්‍රාම නිලධාරීතුමා හරහා හෝ කොළඹ 05 කිරිමණ්ඩල මාවතේ නො 160 / 24 හි පිහිටා ඇති ශ්‍රී ලංකා තොරතුරු හා සංනිවේදන තාක්ෂණ ආයතනය වෙතින් ලබාගත හැක. ICTA e-mail info@icta.lk මගින්ද ලබාගත හැක .

7 සම්පුර්ණ කරන ලද යෝජනා න්‍යාය පත්‍රයේ සඳහන් කර ඇති දිනයට හා වේලාවට හෝ ඊට ප්‍රථම නො 160/24 කිරිමණ්ඩල මාවත, කොළඹ 5හි පිහිටි ICTA වෙත භාරදිය යුතුය .

8 මේ පිළිබදව උනන්දුවක් දක්වන පාර්ශවයන්ට වැඩිදුර විස්තර ICTA ආයතනයට
(දු:ක: 2369099) ඇමතිමෙන් ලබාගතහැක e-mail: info@icta.lk

මෙයට විශ්වාසී
ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය
දිනය



PDF Created with deskPDF PDF Writer - Trial :: http://www.docudesk.com

2 කොටස

**යෝජනා භාරදීමට උපදෙස්**

**1 හැඳින්වීම**

1.1 ශ්‍රී ලංකා තොරතුරු හා සංනිවේදන තාක්ෂණ ආයතනය විසින් න්‍යාය (Schedule)- පත්‍රයේ සඳහන් කර ඇති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක් තුළ නැණසල පිහිටුවීම / මෙහෙයවීම හා අයිතිය ලබා ගැනීම සඳහා සුදුසු සමිති / සංවිධාන / මෙම ලේඛණයේ විස්තර කර ඇති විධි විධානයන්ට අනුකූලව වන පරිදි තෝරා ගැනේ.

1..2 මෙ පිළිබඳව උනන්දුවක් දක්වන පාර්ශවයන් පහත විස්තර කර ඇති ආකාරයට යෝජනා භාරදෙන මෙන් ඇරයුම් කරනු ලැබේ. මෙම යෝජනා ගිවිසුම් සාකච්ජා සඳහා හා අවසානයේ හිමිකරු සමග ගිවිසුම් අත්සන් කිරීම සඳහාත් පදනම වනු ඇත.

1.3 අදාළ පාර්ශවයන් ප්‍රාදේශීය තත්වයන් පිළිබද අවබෝධයක් තිබිය යුතු අතර යෝජනා සකස් කිරීමේදී එම තත්වයන් පිළිබද සැලකිල්ල දැක්විය යුතුය .

**1.4 (i) යෝජනා සකස් කිරීම හා අදාළ ස්ථානය බැහැදැකීම ,ගිවිසුම් සාකච්ජා කොට නියම කර ගැනීමට යන වියදම් නැවත ගෙවනු නොලබන අතර · සහ (ii) ඉදිරිපත් කරන ලද කිසිදු යෝජනාවක් අනුමත කිරීමට ICTA බැඳී නැති බව අදාළ පාර්ශවයන් සිහිතබා ගත යුතුය .**

**2 යෝජනා පත්‍රයට අදාළ පැහැදිලි කිරීම් සහ සංශෝධනයන්**

2.1 යෝජනා භාරදීමට නියමිත දිනට පෙර දින 10 ක් ඇතුළත අදාළ පාර්ශවයන් ICTA වෙතින් ඕනෑම ලේඛණයකට අදාළව පැහැදිලි කිරීමක් කර දෙන මෙන් ඉල්ලා සිටිය හැකි අතර පැහැදිලි කිරීම සඳහා කරනු ලබන ඕනෑම ඉල්ලීමක් ලිඛිතව ඉදිරිපත් කළ යුතුය .

2.2 යෝජනා භාරදීමට පෙර ඕනෑම අවස්ථාවකදී ICTA ආයතනය යම් හේතුවක් මත, තම අභිලාශය මත හෝ පැහැදිලි කිරීමක් සඳහා කරනු ලබන ඉල්ලීමකට පිළිතුරක්, වශයෙන් යෝජනා සඳහා වන අයදුම් සංශෝධනය කිරීමට ඉඩ ඇත.

**3 යෝජනා ඉදිරිපත් කළහැකි භාෂාව**

3.1 පහත සඳහන් ඕනෑම භාෂාවකින් යෝජනා ඉදිරිපත් කළ හැක . (අ) සිංහල (ආ) දෙමළ සහ (ඇ) ඉංග්‍රීසි

**4 යෝග්‍යතාවය සඳහා නිර්ණායකයන්**

4.1 සඳහන් කරන ලද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුළ නැණසල මධ්‍යස්ථානයන්හි පහත සඳහන් සුදුසුකම් සම්පූර්ණ කළ යුතුය .
:අ- යෝජිත නැණසල ඉහත සඳහන් කරන ලද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුළ පිහිටිය යුතුය .

- අයදුම්කරු ලියාපදිංචි සමිතියක් හෝ සංවිධානයක් විය යුතුය.
- සංවිධානයේ ලියාපදිංචි කාලසීමාව අවම වශයෙන් වසර දෙකකට වඩා වැඩිවිය යුතු අතර එය දැනට ක්‍රියාකාරී සංගමයක් විය යුතුය.
- සමිතියේ හෝ සංවිධානයේ සාමාජිකයන් ගණන අවම වශයෙන් 50ක් විය යුතුය.
- අයදුම් කරනු ලබන සංවිධානය / සමිතිය අදාල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සමාජ සේවා කටයුතු හා ග්‍රාමීය සංවර්ධන කටයුතු වල යෙදී සිටිය යුතුය. ( විස්තර අමුණා එවන්න )

**5 යෝජනා සූදානම් කිරීම**

5.1 අදාළ පාර්ශවයන් විසින් යෝජනා සූදානම් කිරීමේදී සියළුම ලේඛණ සැලකිල්ලට භාජනය කරනු අතැයි අපේක්ෂා කෙරේ. ඉල්ලා සිටින ලද තොරතුරු වල අන්තර්ගත අඩුපාඩු යෝජනා ප්‍රතික්ෂේප කිරීමට හේතුවනු ඇත.

5.2 යෝජිත අයදුම්කරු සමිතියක නම් සභාපති හරහා පූජනීය ස්ථානයක නම් නායක ස්වාමීන් වහන්සේ නායක පූජකවරයකු හරහා ඉල්ලුම් කල යුතුය

1. සාමාන්‍ය තොරතුරු (පෝරම A)
2. පිහිටීම යටිතල / ගොඩනැගිලි පහසුකම් පිළිබඳ විස්තර , එම යටිතල පහසුකම් හා ගොඩනැගිලි සඳහා යෝජිත වැඩි දියුණුකිරීම , අයවැය සහ මුදල් සපයා ගන්නා මූලයන් (පෝරම B).
3. අදාළ පාර්ශවයන් පිළිබඳව මූල්‍ය ප්‍රකාශන : සමිති සමාගම් වලට පමණයි- - විස්තර අමුණා එවන්න.
4. <u>සම්පූර්ණ ව්‍යාපාර සැලැස්ම:</u> යොදාගනු ලබන ක්‍රමවේදය පිළිබඳ විස්තර සහ වැඩ සැලැස්ම (පෝරම C)
5. ප්‍රජා සහ ප්‍රජා සහයෝගය පිළිබඳ විස්තර (පෝරම D)
6. පළමු වසර පහ :5- සඳහා අපේක්ෂිත ආදායම / වියදම් ප්‍රකාශන සහ වසර පහට:5- ඔබ්බෙහි තිරසාරත්වය සඳහා වැඩසටහන් (පෝරම E)
7. සැලසුම් කරන ලද කාර්ය මණ්ඩලයේ නම සහ ඔවුන්ගේ සුදුසුකම් සහ පළපුරුද්ද.
8. 7 නැණසල මධ්‍යස්ථානයේ කලමණාකරුවා මධ්‍යසථානය පිහිටි ප්‍රදේශයේ සිට අවම වශයෙන් කිලෝමීටර 10ක වටප්‍රමාණයකට විහිදෙන ආකාරයට ප්‍රජා සේවය ලබාදිය හැකිවිය යුතුයග
9. නැණසල හිමිකරුවන්ගේ අධ්‍යාපන සුදුසුකම් - සහතික පිටපත් සමග (පෝරම F )



PDF Created with deskPDF PDF Writer - Trial :: http://www.docudesk.com

## 3 කොටස
## සේවා විස්තරය

1 ඊ - ශ්‍රී ලංකා වැඩසටහන

ශ්‍රී ලංකා රජය මගින් ආරම්භ කරන ලද ඊ ශ්‍රී ලංකා වැඩසටහනේ අභිලාශය වනුයේ දිවයිනේ සියලුම ජනකොටස් වලට විවිධ හා අසීමිත තොරතුරු මූලයන් හා සංනිවේදන ක්‍රම වෙත ළඟාවීමට අවස්ථාව ලබාදීමයි .

ශ්‍රී ලංකා රජය තොරතුරු හා සංනිවේදන තාක්ෂණයට :

- රටේ ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රවාහය ශක්තිමත් කිරීමට,
- සාම ක්‍රියාවලිය වැඩි දියුණු කිරීමට,
- ජීවන තත්වය උසස් කිරීමට,
- සමාජ හා ආර්ථික වර්ධනය වැඩි දියුණු කිරීමට,

ඇති හැකියාව අවබෝධ කරගනිමින් ඊ ශ්‍රී ලංකා ව්‍යාපෘතිය කොටසක් ලෙස නැණසල වැඩසටහන දියත්කොට ඇත . නැණසල වැඩ සටහනෙහි අරමුණ වන්නේ විශේෂයෙන්ම ග්‍රාමිය ප්‍රදේශවල අවශ්‍ය තොරතුරු හා සංනිවේදන තාක්ෂණ සේවා සැපයීමයි. නැණසල වැඩ සටහනෙහි ප්‍රධාන කොටස් දෙකකි.

- o කලාපීය විදුලි සංදේශ ව්‍යාපෘතිය ,අරමුදල් රැස් කිරීම කළමණාකරණ හා බෙදාහැරීම සදහා කාර්යක්ෂම සහ ඵලදායිතාවයෙන් යුතු යන්ත්‍රණයන් සම්පාදනය කිරීම අරමුණු කොටගත් මෙම ව්‍යාපෘතිය තොරතුරු හා සංනිවේදන තාක්ෂණ ජාලයක් ඇති කිරීමට බලාපොරොත්තු වේ.
- o නැණසල ව්‍යාපෘතිය, මෙහි අරමුණ රටපුරා නැණසල මධ්‍යස්ථාන ඇතිකිරීමයි.

**2 නැණසල ව්‍යාපෘතිය**

නැණසල ඊ ශ්‍රී ලංකා වැඩ සටහන යටතේ ක්‍රියාත්මක වන එක් ව්‍යාපෘතියකි . මෙම ව්‍යාපෘතිය තෝරාගත් දිස්ත්‍රික්කවල තොරතුරු තාක්ෂණය සහ සංනිවේදන අවශ්‍යතාවන් සපිරීම සදහා අවශ්‍ය යටිතල පහසුකම නැණසල මධ්‍යස්ථාන පිහිටුවීම මගින් හා විවිධ ICTA පදනම් කරගත් සේවා මගින් සැපයීමට බලාපොරොත්තු වේ.

තොරතුරු සංනිවේදන තාක්ෂණය ව්‍යාප්තිය හා භාවිතය ග්‍රාමිය ප්‍රදේශවල සීමාසහිත නිසා මේ සදහා ප්‍රවේශයක් ලබාදීමට වඩාත් කාර්යක්ෂම සහ ඵලදායිතාවයෙන් යුතු මාර්ගය නැණසල ස්ථාපනය කිරීම බව අවබෝධ කරගෙන ඇත . නැණසලහි ප්‍රධාන අරමුණ වනුයේ පහත සදහන් අවස්ථාවන්හිදී ප්‍රජාවට සහයෝගය දැක්වීමයි . නැණසල මධ්‍යස්ථාන මගින් සපයනු ලබන සේවා සහ සහායකයින් දිර්ඝ කාලින තිරසාරත්වය තහවුරු කරන බවට සහතික විය යුතුය .

**3 නැණසල මගින් සැපයීමට බලාපොරොත්තු වන සේවා**

නැණසල මගින් සැපයීමට බලාපොරොත්තු වන සේවා පහත දැක්වෙ, (නමුත් සීමා නොවේ )

- අන්තර්ජාල පහසුකම
- ඊ - මේල් සේවා
- මුද්‍රණ සේවා
- ලේඛණ සියුම් ලෙස පරික්ෂා කිරීම
- පරිගණක සේවා
- තොරතුරු තාක්ෂණය පුහුණු
- දේශිය හා ජාත්‍යන්තර දුරකථන සබදතා
- තොරතුරු සේවාවන් ප්‍රචාරය කිරීම
- රජයේ තොරතුරු ලබා දීම

නැණසල පහත සදහන් උපකරණ වලින් සමන්විත වේ .

- පරිගණක 3
- මුද්‍රණයන්ත්‍ර 1
- ස්කැනර් 1
- හදිසි බල සැපයුම 4
- Ethernet Switch 1
- Network Cabling
- අන්තර්ජාල සබදතා



PDF Created with deskPDF PDF Writer - Trial :: http://www.docudesk.com

**4 සම්බන්ධිත සංවිධාන**

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා සම්බන්ධ වන සංවිධාන:

- ශ්‍රී ලංකා තොරතුරු හා සංනිවේදන තාක්ෂණ ආයතනය
- නැණසල හිමිකරු / මෙහෙයවන්නා
- අන්තර්ජාල පහසුකම් සපයන්නා
- පරිගණක සහ අනිත් උපකරණ සපයන්නා

**5 සම්බන්ධිත කණ්ඩායම් වල වගකීම**

ව්‍යාපෘති කළමණාකරණය සහ ක්‍රියාත්මක කිරීම සඳහා සම්බන්ධ කණ්ඩායම්වල භූමිකාව සහ වගකීම පහත ඒවා වේ.

5.1 ශ්‍රී ලංකා තොරතුරු හා සංනිවේදන තාක්ෂණ ආයතනය

- ශ්‍රී ලංකා තොරතුරු හා සංනිවේදන තාක්ෂණ ආයතනය පහත සඳහන් වගකීම් දරණු ලැබේ .
- සියලුම පාර්ශවයන් අතර සම්බන්ධීකරණය , කළමණාකරණ සහ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම.
- දිවයින හරහා නැණසල පිහිටුවීමට අවශ්‍ය උපකරණ සැපයීම මගින් අවශ්‍ය මූල්‍ය සහායෝගය ලබාදීම .
- වැඩ සටහන සාර්ථකව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිසරය සැකසීම
    - වැඩ සටහන සඳහා අඛණ්ඩව නිරීක්ෂණ කිරීම සහ ඇගයීම
    - නැණසල කළමණාකරණයට අදාළ වඩාත් සුදුසුම ක්‍රම හඳුනාගැනීම සහ භුවමාරු කරගැනීම
    - නැණසල කළමණාකරණය වැඩි දියුණු කිරීම සඳහා නිර්දේශ සැපයීම

5.2 නැණසල හිමිකරු / මෙහෙයවන්නා

නැණසල හිමිකරු / මෙහෙයවන්නා ගේ වගකීම

- නැණසල සඳහා අවශ්‍ය සේවක මණ්ඩලය බඳවා ගැනීම
- නැණසල හරහා විශේෂිත සේවා සැපයුම
- ශ්‍රී ලංකා තොරතුරු හා සංනිවේදන තාක්ෂණ ආයතනය හා ඔවුන් අතර අත්සන් තබන ලද ගිවිසුමෙහි ප්‍රකාර අවශ්‍යතාවයන් සැපිරීම .

**6 වැඩ පිළිවෙල'(Arrangement)–**

සකස් කොට ඇති සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී සම්පූර්ණ වන වැඩ පිළිවෙල මෙසේය .

6.1 මූල්‍ය වැඩ පිළිවෙල (Financial Arrangements):

පහත සඳහන් මූල්‍ය පහසුකම් ICTA මගින් සපයනු ලැබේ

(කොටස 3 පරිච්ජේද 3 හි සඳහන්) මූලික උපකරණ මිලදී ගැනීම කරනු ලබන අතර ඊට අමතරව පහත සඳහන් අන්තර්ජාල සම්බන්ධතා පිරිවැයන් (connectivity cost) ගෙවනු ලැබේ,

- මෙහෙයවීම වසර 2009 දක්වා සම්බන්ධතා පිරිවැය 100% ක් දරනු ලබයි. ( ICTA ') මගින් යෝජනා පිළිගැනීමෙන් මසකට පසු සිට ගෙවීම ආරම්භ වේ )

- වසර 2010 සිට ඉදිරියට නැණසල හිමිකරු 100% ක් සම්බන්ධතා පිරිවැය දරනු ඇත .

පහත සඳහන් ඒවාට මූල්‍ය ප්‍රතිපාදන නැණසල හිමිකරුගේ වගකීමකි:

- මධ්‍යස්ථාන පවත්වාගෙන යාමේ වියදම
- සේවක මණ්ඩලයේ වැටුප් හා වියදම්
- අනෙකුත් උපකරණ මධ්‍යස්ථාන හා 6.2 සඳහන් කර ඇති පරිදි ගෘහභාණ්ඩ
- නැණසල මධ්‍යස්ථාන ස්ථාපනය කිරීම සහ ක්‍රියාත්මක කිරීමට යන ඕනෑම පිරිවැයක්



PDF Created with deskPDF PDF Writer - Trial :: http://www.docudesk.com

6.2 උපකරණ සැපයීම

පහත වගුවේ සදහන් ෂඹ උපකරණ (1) ICTA මගින් සපයනු ලැබේ. නැණසල හිමකරු සේවා සැපයීම සඳහා අවශ්‍යයයි සලකන අනෙකුත් උපකරණ මලදී ගත යුතුය.

වගුව 1 ICTA සහ නැණසල හිමකරු සැපයිය යුතු උපකරණ ගෘහභාණ්ඩ

| අංක | Items | සැපයිය යුතුය | |
|---|---|---|---|
| | | ICTA මගින් | නැණසල මගින් |
| 1 | IT උපකරණ | | |
| 1.1 | පරිගණක - 3 | x | |
| 1.2 | මුද්‍රණයන්ත්‍ර - 1 | x | |
| 1.3 | ස්කැනර් - 1 | x | |
| 1.4 | UPS - 4 | x | |
| 1.5 | Ethernet Switch - 1 | x | |
| 1.7 | Network Cabling | x | |
| 1.8 | අන්තර්ජාල සබදතා | x | |
| 1.9 | අනෙකුත් උපකරණ | | |
| 1.9 | Ac විදුලිපංකා ආදිය | | x |
| | | | |
| | | | |
| 2 | ස්ථානය හා ගෘහභාණ්ඩ | | |
| 2.1 | ස්ථානය | | x |
| 2.2 | ඩෙක්ස් | | x |
| 2.3 | පුටු | | x |
| 3 | Power outlets | | x |
| 3.1 | රාක්ක ( අවශ්‍ය පරිදි ) | | x |
| 3.2 | සනිපාරක්ෂක සේවා | | x |

ICTA විසින් මලදී ගන්නා සියලුම උපකරණවල හිමකම ICTA සතුවේ . එසේ වුවද වසර 4ක් අවසානයේදී උපකරණවල ඉතිරි වටනාකම ගෙවීමෙන් ඒවායේ හිමකම නැණසල හිමකරුට ලබාගැනීම හෝ ICTAවෙත එම උපකරණ නැවත දීම හෝ කළ හැකිය . ක්‍රියාත්මක කිරීමේ පළමු වසර 4 ඇතුළත ICTA හි පිළිගැනීමට අනුකූලව නැණසල හිමකරු සැහීමකට පත්විය හැකි සේවාවක් සපයන්නේ නැත්නම් හෝ ( කොටස 3 හි පරිච්ඡේද 6 හි ප්‍රකාර ) ආකාරයට සම්බන්ධතා පිරිවැය දරන්නේ නැත්නම් හෝ ICTA මගින් සපයන ලද IT උපකරණ මසක දැනුම්දීමකින් ආපසු ගනු ඇත

**7 නැණසල මධ්‍යස්ථාන පිහිටම**

- පවතින විදුලි සංදේශ සේවා සැපයීම පුළුල් කිරීමේදී යෝජිත නැණසල මධ්‍යස්ථාන ප්‍රජාවේ සියලු සාමාජිකයන්ට ළඟාවීමට පහසුවන ස්ථානයක පිහිටවිය යුතුය .
- නව නැණසල මධ්‍යස්ථානය ක් ඉදිකිරීමේදී දැනට පවතින නැණසල මධ්‍යස්ථානයේ සිට අඩුම තරමින් කිලෝමටර දහයක (10 ) වටප්‍රමාණයකට එපිටින් පිහිටවිය යුතුය.
- යෝජිත නැණසල මධ්‍යස්ථාන ග්‍රාම නිලධාරි කොට්ඨාශයකට අයත් ගමක් තුළ පිහිටවිය යුතුය .

7.1 නැණසල වටපිටාව

නැණසල මධ්‍යස්ථානයක් තුළ අඩුම තරමින් පහත සඳහන් දේ තිබිය යුතුය.

- උපකරණ තබන ස්ථානය අවමය වර්ග අඩි 300ක ආවරණයක් සහිත දූවිලි රහිත ස්ථානයක් විය යුතුය. හෝ
- උපකරණ තබන ස්ථානය ආවරණ සහ දූවිල්ලෙන් තොර එක් කාමරයක් වර්ග මීටර 20-30 බැගින් යාබද කාමර දෙකක් (2)

ක්‍රියාත්මක කරන අවස්ථාවේදී නැණසල උපකරණ සවිකිරීම පිළිබද අදාළ සැලැස්ම සපයනු ලැබේ



PDF Created with deskPDF PDF Writer - Trial :: http://www.docudesk.com

**පෝරම**
**සාමාන්‍ය තොරතුරු**

**(අ)**

| |
|---|
| 1. අයදුම්කරන සමිතිය / සංගමයේ නම : |
| 2. තැපැල් ලිපිනය : |
| 3. විහාරාධිපති / පූජකතුමා / සමිතියේ / සංගමයේ සභාපතිගේ නම : |
| 4. දුරකථන : ෆැක්ස් :<br>ජංගම දුරකථන අංකය : ඊ මේල් : |
| 5. නීතිගත කරන ලද / ලියාපදිංචි කිරීම පිලිබඳ විස්තර : (සකාශී ඉදිරිපත් කළ යුතුය. - ලියාපදිංචි සහතිකයේ පිටපතක් අමුණා එවන්න ) |
| 5.1 සංගමයේ / සමිතියේ ලියාපදිංචි අංකය : |
| 5.2 සංගමයේ / සමිතියේ ලියාපදිංචි ලිපිනය : |
| 5.3 සංගමය / සමිතිය ලියාපදිංචි කරන ලද දිනය හා වර්ෂය : |
| 6. යෝජිත ස්ථානයේ පිහිටීම :<br>6.1 දිස්ත්‍රික්කය : __________<br>62 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය : __________<br>6.3 ග්‍රාම නිලධාරී වසම හා අංකය : __________ |
| 7. ගොඩනැගිල්ලේ ස්වභාවය :<br>7.1 පූජනීය ස්ථානයක් ☐ 7.3 නිවසක් ☐<br>7.2 පෞද්ගලික ගොඩනැගිල්ලක් ☐ 7.4 නව ගොඩනැගිල්ලක් ඉදි කිරීම ☐ |
| 8. ප්‍රදේශයේ පදිංචිකරුවන් සංඛ්‍යාව ☐<br>9. අවට තිබෙන පාසල් සංඛ්‍යාව ☐<br>10. ලගම ඇති ප්‍රධාන නගරය හා දුර [ km ]<br>11. ලගම පිහිටි නැණසල [ ]<br>12. ඔම ස්ථානයේ සිට දුර ප්‍රමාණය [ km ] |



PDF Created with deskPDF PDF Writer - Trial :: http://www.docudesk.com

**පෝරම B**

**ස්ථානය , යටිතල පහසුකම / ගොඩනැගිලි පිළිබඳ තොරතුරු**

1- යෝජිත ස්ථානයේ ලිපිනය : -------------------------------------------------------------------------------------------

----------------------------------------------------------------------------------------------------------

----------------------------------------------------------------------------------------------------------

------------------------------------------------------------

(යෝජිත ස්ථානයේ පින්තූරයක් යෝජනා කෙරේ)

2- යෝජිත ස්ථානය ග්‍රාම නිලධාරී කොට්ඨාශය තුළ පිහිටා ඇති බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය . (ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ සහතිකයක් යෝජනා කෙරේ)

3- ප්‍රධාන සමිතිය හෝ සංගමය ග්‍රාම නිලධාරී කොට්ඨාශ තුළ හෝ මධ්‍යස්ථාන පිහිටි ස්ථානයේ සිට 10km ක් ඈතුලත පදිංචිව සිටිය යුතුය. ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ සහතිකයක් යෝජනා කෙරේ

4. පූජනීය ස්ථානයක් නම් මධ්‍යස්ථානය පූජනීය ස්ථානය තුල පිහිටුවිය යුතුය

5- අන්තර්ජාල හා ඊ - මේල් පහසුකම සපයන ළඟම පිහිටි මධස්ථානයේ නම සහ ස්ථානය : ------------------------

------------------------------------------------------------------------------------------------------------

6 - යෝජිත මධස්ථානයේ සිට ඉහත මධස්ථානයට දුර : ------------------------------------------------

7 - ළඟම පිහිටි බස් නැවතුම්පළෙහි සිට යෝජිත මධස්ථානයට දුර : ----------------------------------------

8 - ගොඩනැගිල්ලේ අවම වසර 4ක කාලයකට හිමිකම/ කුලී / බදු පිළිබද විස්තර(සාක්ෂි ඉදිරිපත් කළ යුතුය) අමුණා එවන්න

9 - ගොඩනැගිල්ලේ ස්වභාවය පිළිබද විස්තර

| | |
|---|---|
| බිත්ති | |
| වහලය | |
| බිම | |

10 - බිම ප්‍රදේශය ගොඩනැගිල්ලේ පාවිච්චිය (කාමර , කොරිඩෝ ,වැසිකිලි ආදිය දළ සැලැස්ම ඉදිරිපත් කළ යුතුය)

11- සේවා පහසුකම

| | ඇත | නැත |
|---|---|---|
| විදුලිය | | |
| ජලය | | |
| දුරකථන | | |
| වෙනත් | | |

12- යෝජිත වැඩි දියුණු කිරීම (විස්තර කළ යුතුය )

13- යෝජිත වැඩි දියුණු කිරීම සදහා මුල්‍ය ප්‍රතිපාදන කෙරේ) (විස්තර කළ යුතුය )



PDF Created with deskPDF PDF Writer - Trial :: http://www.docudesk.com

**පෝරම C**

ව්‍යාපාර සැලසුම

නැණසල මධ්‍යස්ථානය පවත්වාගෙන යාමේ වැඩ සැලස්ම සහ ක්‍රමවේදය පිළිබඳ විස්තරය

- **ක්‍රමවේදය-**

| |
|---|
| 1– තොරතුරු තාක්ෂණ සේවාවන් : |
| |
| |
| |
| |
| 2- වැඩිදියුණු කිරීම හා ප්‍රචාරණ කටයුතු : |
| |
| |
| |
| |
| |
| |
| 3- ප්‍රජා සහභාගිත්වය : |
| |
| |
| |
| |
| |
| |
| |
| |
| 4- වෙනත් අදහස් : |
| |
| |
| |
| |



PDF Created with deskPDF PDF Writer - Trial :: http://www.docudesk.com

**පෝරම D**

දැනට කරන ලද  ප්‍රජා සංවර්ධන කටයුතු සහ ඒ සඳහා ලැබී ඇති ප්‍රජා ප්‍රතිචාරය පිළිබඳ විස්තර

| ක්‍රියාකාරීත්වය | විස්තර |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |



PDF Created with deskPDF PDF Writer - Trial :: http://www.docudesk.com

## පෝරම E

1 පළමු වසර 5 සදහා අපේක්ෂිත ආදායම , වියදම
2 අවුරුදු 5 න් ඔබ්බට තිරසාරත්වය පිළිබද වැඩ සටහන

අපේක්ෂිත ආදායම

| Description | 2008 | 2009 | 2010 | 2011 |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| **Total Revenue** | | | | |

අපේක්ෂිත වියදම

| Description | 2008 | 2009 | 2010 | 2011 |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| **Total Expenses** | | | | |

| | | | | |
|---|---|---|---|---|
| **Net Profit/Loss** | | | | |



PDF Created with deskPDF PDF Writer - Trial :: http://www.docudesk.com

**පෝරම F**

**සැලසුම් කළ කාර්ය මණ්ඩලයේ නම සුදුසුකම සහ පළපුරුද්ද**

**සමිතියේ හෝ සංගමයේ ව්‍යාපෘති කළමනාකරුවකු යෝජනා කල යුතුය**

| නම | තනතුර | සුදුසුකම සහ පළපුරුද්ද |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |

**<u>* සැ.යු :</u>**

**( නැණසල හිමිකරුවන්ගේ අධ්‍යාපන සුදුසුකම් සහතික පිටපත් සමග එවන්න )**

මා විසින් සම්පූර්ණ කරන ලද අයදුම් පත්‍රය හුදෙක් පළමු අදියර වශයෙන් දත්ත රැස්කර ගැනීම සඳහා පමණක් බවත් මෙම විස්තර ලබා ගන්නේ මාහට නැණසල මධ්‍යස්ථාන හිමිකර ගැනීමට අවශ්‍ය සුදුසුකම් ඇත්දැයි දැන ගැනීම සඳහා පමණක් බවත් , ඒ අනුව තෝරා ගන්නා ලද අයදුම්පත්‍ර පමණක් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු බව දන්නා අතර, තෝරා ගැනීමේ අයිතිය **ඉකඔ** ආයතනය සතුබව හොඳින් දන්නා බව පහත අත්සන් තබන මා මින් ප්‍රකාශ කර සිටිමි.

අත්සන
( විහාරස්ථාන විහාරාධිපති ස්වාමීන් වහන්සේ /
සමිතියේ සභාපති / ප්‍රධාන පූජකතුමා)

දිනය



PDF Created with deskPDF PDF Writer - Trial :: http://www.docudesk.com

**යෝජිත නැණසල මධ්‍යස්ථානයේ ක්ෂේත්‍ර පරීක්ෂාව සඳහා තොරතුරු ලබා දීම.**

ඔබ විසින් ඉල්ලුම්කර ඇති නැණසල මධ්‍යස්ථානයේ ක්ෂේත්‍ර පරීක්ෂාව සඳහා මෙම තොරතුරු සම්පූර්ණ කරන්න.

1) සමිතියේ නම : …………………………………………………………….
2) ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය : ……………………………………………..
3) දුරකථන අංක : (දුරකථන නොමැතිනම් ලඟම ඇති දුරකථන අංකයක් සඳහන් කරන්න ) ……………………………………………………………………………
4) කොළඹ සිට ඔබ සමිතිය පිහිටා ඇති ස්ථානයට පැමිණීමට හැකි මාර්ගය පැහැදිලිව ඇඳ දක්වන්න.



PDF Created with deskPDF PDF Writer - Trial :: http://www.docudesk.com